**නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව - 2020**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
--------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී,රීතීවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---------------------------------------------------------------------------

**1.6.1. ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 161 ප්‍රකාරව ප්‍රාදේශීය සභා 17 ආකෘති පත්‍රය අනුව ආදායම් වියදම් ගිණුම සඳහා ඉදිරිපත් කළ යුතු වැඩසටහන් 06 ක් වුවද, සේවා හා බදු, කසල රැස්කිරීම වශයෙන් අමතර වැඩ සටහන් 02 ක් සමාලෝචිත වර්ෂයේ දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දන්වා ඇත. | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතී ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | පළාත් පාලන ආයතන ප්‍රතිපාදන යටතේ ඉකුත් වර්ෂයේ මිළට ගෙන තිබුණු රු.1,694,999 ක් වටිනා ලී බඩු හා උපකරණ අයිතම 19 කට අයත් භාණ්ඩ 172 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දන්වා ඇත. | ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,612,569 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,105,145 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| **i.** 2020 වර්ෂය තුළ බිල්කළ රු.2,081,205 ක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර අයකර අවසන් කළ යුතු වුවද, වර්ෂය තුළ අයවී තිබුණේ රු.1,637,270 ක් විය. | 2021 වර්ෂය තුළ අය කිරීමට පියවර ගන්නා බව දන්වා ඇත. | ආදායම් රැස්කිරීම නිසි ලෙස ඉටු කළ යුතු වීම. |
| **ii.** ජල සැපයුම් සේවා ගාස්තු ලෙස 2020 දෙසැම්බර් 31 දිනට ජල පාරිභෝගිකයින් 82 දෙනෙකුගෙන් රු.175,446 ක් අයවීමට පැවතුණෙන් සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය ප්‍රමාණවත් නොවිය. | ඉදිරියේදී අයකරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අය කරගැනීමට ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| **i.** මුද්දර ගාස්තු හා උසාවි දඩ රු.2,490,349 ක ඇස්තමේන්තුගත ආදායමක් අපේක්ෂා කළද අයවීම රු.577,188 ක් විය. | 2020 ජුලි සිට දෙසැම්බර් දක්වා ලේඛන ලැබී නොමැති බව දන්වා ඇත. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **ii.** පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,629,316 ක් හා ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.1,500,000 ක් විය. | 2020 ජුලි සිට දෙසැම්බර් දක්වා ලේඛන ලැබී නොමැති බව දන්වා ඇත. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජනතා හිතවාදී සේවාවක් ලබා දීම සඳහා පෙරටු කාර්යාල සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන හඳුන්වාදිය යුතු වුවද, සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි | ඉදිරියේදී ස්ථාපිත කරන බව දන්වා ඇත. | පෙරටු කාර්යාල හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන හඳුන්වා දිය යුතු වීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ලබාගත් පොත්වලින් ආපසු ලබා නොදුන් පොත් 406 ක් පැවති අතර එහි මූල්‍යමය වටිනාකම ලබාදීමට නිලධාරීන් අපොහොසත් විය. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දන්වා ඇත. | පොත් ආපසු ගෙන්වා ගැනීමට හෝ මූල්‍යමය අලාභය අය කර ගත යුතු වීම. |
| (ආ) | අඹගමුව ප්‍රාදේශීය සභාව විසින් නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව වෙත භාරදෙන ලද හොන්සි නිල නිවාසය පිහිටා ඇති ස්ථානයේ පසු පස විගණිත දින 2021 පෙබරවාරි 02 දින වන විටත් වෙනත් පාර්ශවයක් විසින් අඩි 04 ක පමණ අනවසර බැම්මක් ඉදිකරමින් පැවතුණි. ඉඩමෙන් වර්ග අඩි 50 ක පමණ ප්‍රමාණයක් මෙම ඉදිකිරීම නිසා සභාවට අහිමි වී තිබුණි. | නීත්‍යානුකූල ඔප්පුවක් නොමැති බැවින් අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පියවරගත නොහැකි බව දන්වා ඇත. | අනවසර ඉදිකිරීම් නියමානුකූල කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | අඹගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව ලෙස අළුතින් ස්ථාපිත කිරීමේදී ඉඩම් කට්ටි 23 ක් නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබුණද, පරීක්ෂණ දිනය වන විටද, අදාළ ඉඩම් කොටස්වල ඔප්පු නොතිබීම, සැලැසුම් නොතිබීම, බදු දීමේදී ගිවිසුම් අත්සන් නොකිරීම, ගිවිසුමේ තක්සේරු වටිනාකම සඳහන් නොකිරීම වැනි අඩුපාඩු පැවතුණි. | ප්‍රකාශන ඔප්පු සකස් කරමින් පවතින බව දන්වා ඇත. | සභාව සතු වත්කම් ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ වාර්ෂිකව ජනනය වන කසල ප්‍රමාණය ටොන් 1080 ක් පමණ වන බව නිරීක්ෂණය වන අතර එම කසලවලින් කාබනික පොහොර සැකසීම, ජීව වායු නිපදවීම වැනි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු නොකොට සභා බල ප්‍රදේශයෙන් බැහැර මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ කසළ අංගනයට කසළ බැහැර කිරීම පමණක් සිදුකොට තිබුණි. 2020 වර්ෂයේදී කසළ කළමනාකරණය වෙනුවෙන් රු.5,168,600 කට ආසන්න මුදලක් වැයකර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දන්වා ඇත. | කසළ කළමනාකරණය විධිමත් කරගත යුතු වීම. |